සැ. යු. - 2018.01.26 දින පළ වූ අංක 2,056 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,057 - 2018 පෙබරවාරි මස 02 වැනි සිකුරාදා - 2018.02.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## (IVආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 222 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥානත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 225 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 පෙබරවාරි මස 23 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 පෙබරවාරි මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

ගෝඝාතක ආඥාපනත 272 වන අධිකාරය යටතේ කරන දැනුම් දීමයි

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නම සඳහා වන අය විසින් ඔහුගේ නමට ඉදිරියෙන් සඳහන් කර ඇති ස්ථානයෙහි ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලමින් අයදුම්පත්‍රයක් මා වෙත ඉදිරිපත් කර ඇති බවත් එම බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් කුලියාපිටිය ප්‍රාදේශීය සභ බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතුව ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ වූ දින සිට දින 21 ක් ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බවත් ගෝඝාතක ආඥාපනතේ 272 වන අධිකාරය අංක 7(2) වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ස්වභාවය* | *ඉදිකරන ස්ථානය* |
|---|---|---|
| ජුනයිදීන් සහීල්<br>මැටිවැව<br>කැකුණගොල්ල | ගෝඝාතකාගාරයක් | අංක 7852 සහ 2017.08.04 දිනැති ඔප්පුවේ සඳහන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පල හත්පත්තුවේ මැද්දේකැටිය කෝරළයේ මැටිවැව ගමේ පිහිටි කොන්ගහමුල වත්ත නැමැති ඉඩම |

ජයසිංහ ආරච්චිලාගේ සුජීවනී ජයසිංහ,
ලේකම්,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව,
කුලියාපිටිය.

2017 දෙසැම්බර් මස 29 වැනි දින,

02-09

---

## මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව

සම්මත අතුරු ව්‍යවස්ථා

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනත**

261 වන අධිකාරය වන 1952 අක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(03) උපවගන්තිය ප්‍රකාරව පහත සඳහන් තීරණය මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. පී. නවරත්න,
ලේකම්,
මහනුවර කඩවත් සතර සහ
ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව,
අම්පිටිය.

2017 දෙසැම්බර් මස 21 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ දී ය.

*තීරණය*

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ(අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මධ්‍යම පළාත් පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016.02.23 වැනි දින අංක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ හා මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කොට 2017.05.05 වැනි දින අංක 2017/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලදදා වූ පහත සඳහන් කොට ඇති අතුරු ව්‍යවස්ථා,

01 සේවා සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
02 ත්‍රි රෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
03 මහජන පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
04 සංචාරක වෙළෙඳාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
05 පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදයක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදයක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
06 මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
07 සැරසිළි විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව
08 මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

මෙම තීරණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක කිරීමටත්, ඊට පෙර දින මධ්‍යම රාත්‍රි 12 සිට මීට පෙර ඉහතින් සඳහන් කරන්නට යෙදුන අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක වූ සියලුම අතුරු ව්‍යවස්ථා අවලංගු කිරීමටත් හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(03) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2017.12.21 වැනි දින සභාවේ තීරණ අංක 513 යටතේ මෙයින් තීරණය කරමි.

02-10

---

**කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව**

විනෝද බදු ආඥපනත යටතේ ඒ සඳහා ගාස්තු අය කිරීම - 2018

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9:3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව විනෝද බදු ආඥපනතේ 2 වන වගන්තියේ 01 උප වගන්තියෙහි විධිවිධාන කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව සඳහා 2018 වර්ෂයට අදළ විනෝද බදු ගාස්තු නියම කිරීමට 2017 වර්ෂයේ දෙසැම්බර් 15 වන දින තීරණ අංක 585/2017 යටතේ පහත ආකාරයට තීරණය කරන බව මෙයින් නිවේදනය කරමි.

එස්. ආර්. ආතාවුද,
ලේකම්,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව,
මැණික්හින්න.

2017 දෙසැම්බර් මස 15 වැනි දින,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

විනෝද බදු ආඥපනතේ 2 වගන්තියේ 01 උපවගන්තිය යටතේ අය කරන ලද විනෝද බදු මුද්‍රිත ප්‍රවේශ පත්‍රවල සඳහන් වටිනාකමෙන් 5% - 25% දක්වා මුදලක් අය විය යුතු අතර එම මුදල මහ සභාවේ තීරණය මත විනෝද බදු වශයෙන් සභාවට ගෙවිය යුතු යැයි තීරණය කරමි.

02-114

**දෙහිඕවිට ප්‍රාදේශීය සභාව**

ගෝඝාතක ආඥාපනත (272) වැනි අධිකාරය

අවිස්සාවේල්ල, නාපාවල එම්. ඩබ්. එම්. රිස්වාන් නැමැති අය අවිස්සාවේල්ල, නාපාවල එම්. එම්. එම්. නියාස් නැමැති අයට අයත් සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අටුළුගම කෝරළේ නාපාවල ගමේ පිහිටි රත්තෙවල්ලන්ගසින්නන්ගගේ වත්ත නැමැති ඉඩමේ 2018.12.31 දින දක්වා ගෝඝාතකාගාරයක් ඉදි කිරීමට අවසර ඉල්ලා ඇත.

මේ සම්බන්ධයෙන් දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් ඔහු/ඇය විරුද්ධ වීමට හේතු වූ කරුණු පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීමේ සඳහන් දින සිට දින 14ක් ඇතුළත ලේඛනගත තැපෑලෙන් මා වෙත දැන්විය යුතු බව ගෝඝාතක පනතේ (272 වැනි අධිකාරය) 7(2) වගන්තිය ප්‍රකාර මෙයින දැනුම් දෙනු ලැබේ.

ටී. ආර්. සී. කේ. ගුණසේකර,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
දෙහිඕවිට.

2018 ජනවාරි මස 16 වැනි දින,
දෙහිඕවිට ප්‍රාදේශීය සභා වේ දී ය.

02-158

---

**අකුරණ ප්‍රාදේශීය සභාව**

2018 වර්ෂය සඳහා ගෝඝාතක ආඥාපනත

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අකුරණ ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ජනවාරි මස 10 වන දින තීරණ පොතෙහි තීරණ අංක 355/2018 යටතේ හා 2018 වර්ෂයේ ජනවාරි මස 12 වැනි දින තීරණ පොතෙහි තීරණ අංක 356/2018 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කළ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් තැනැත්තන් විසින් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දැක්වෙන ගවමස් වෙළඳසැළක් පවත්වාගෙන යාමට ගෝ ඝාතක ආඥාපනතේ 07(1) වැනි වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරන ලෙස අකුරණ ප්‍රාදේශීය සභාවේ නිසි බලධාරියා වන මා වෙතින් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබේ.

පහත උපලේඛනයේ සඳහන් ස්ථානයන්හි ගවමස් වෙළඳසැලක් පවත්වාගෙන යාම වෙනුවෙන් බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධත්වයක් දක්වන්නන් වෙතොත් එසේ විරුද්ධත්වය දැක්වීමට හේතු සඳහන් කරමින් මේ නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දිනයේ සිට සති 04ක් ගෙවීමට මත්තෙන් පිටපත් දෙකකින් යුක්තව ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දෙන ලෙස අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන් වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එස්. රාජපක්ෂ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

2018 ජනවාරි මස 16 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම* | *ගවමස් වෙළඳ සැල පවත්වාගෙන යාමට අපේක්ෂිත ස්ථානය* |
|---|---|---|
| 01 | ඒ. ඒ. එම්. සරුක් මයා | අංක 357/1/ඒ, පල්ලේවැලිකැටිය, බුළුගොහොතැන්න, අකුරණ |
| 02 | එම්. ජේ. එම්. ෆයිසිල් මයා | අංක 353/3, පන්ගොල්ලාමඩ, අකුරණ |

02-189

# විවිධ දැන්වීම්

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

### 2018 වර්ෂය සඳහා බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147, 149, 150, 152 වගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන වෙළඳ පරිශ්‍ර හා වෙළඳ ව්‍යාපාරවලින් බදු හා බලපත්‍ර ගාස්තු 2018 වර්ෂය සඳහා පනවා අය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2017.10.09 දින අංක 10 යටතේ තීරණය කර ඇති බැවින් අදාළ ගාස්තු 2018 මාර්තු 31 වන දිනට ප්‍රථම ගෙවිය යුතු බවට නිවේදනය කරමි.

පාලිත දේවනාරායන,
ලේකම්,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2017 දෙසැම්බර් මස 04 දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.

02-11/1

---

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

### 2018 වර්ෂය සඳහා ඇතැම් ව්‍යාපාර බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147,152 වගන්තිය සමඟ කියවිය යුතු (1) වැනි උප වගන්තියේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බදද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තිකයෙක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත 2018 වර්ෂයේදී කරගෙන යනු ලබන සෑම තැනැත්තතෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුලත පවත්නා අවස්ථාවක එහි දෙවන තීරුවේ අනුරූපිත සටහන් නිරූපිත අනුප්‍රමාණ අනුව වූ ව්‍යාපාර බද්දක් 2018 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් බද්දට යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2018 වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර වැල්ලවාය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9(2) 9(3) වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරමි.

පාලිත දේවනාරායන,
ලේකම්,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව

2017 දෙසැම්බර් මස 04 දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

(i) වන උපලේඛනය

බද්ද අදාළ වන වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය

| | *(i) වන තීරුව* | *(ii) වන තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශ.* |
|---|---|---|
| 01. | රු 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 02. | රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට | 90 0 |
| 03. | රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මන විට | 180 0 |
| 04. | රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 360 0 |
| 05. | රු. 75,000 ඉක්මවන විට නමුත් රු. 1,50,000 නොඉක්මවන විට | 1,200 0 |
| 06. | රු. 150,000.00 ඉක්මවනවිට | 3,000 0 |

(ii) වන උපලේඛනය

''වෙළඳ ව්‍යාපාරය'' යන්නට, යම් කර්මාන්තයක්, හෝ නිෂ්පාදනයකුගේ හෝ යම් ගනුදෙනුවක් හෝ ඉටු කළ සේවා සම්බන්ධයෙන් කොමිස් මුදලක් හෝ ගාස්තුවක් ලබා ගන්නා යම් තැනැත්තකුගේ වෙළඳ ව්‍යාපාරය හෝ ස්වාධීන කොන්ත්‍රාත්කරුවකුගේ ව්‍යාපාරය ඇතුලත් වන නමුත්, භාණ්ඩ බඩු හෝ ද්‍රව්‍ය පෞද්ගලික පොළක විකිණීමේ රක්ෂාව හෝ රාජ්‍ය අරමුදලින් ප්‍රධානයක් ගෙවනු ලබන්නා වූ හෝ කලින් එවැනි ප්‍රදානය කරන ලද නමුදු දැනට ගෙවනු නොලබන්නා වූ යම් අධ්‍යාපනික ආයතනයක් හෝ පාසලක් පවත්වාගෙන යාමේ රක්ෂාව ඊට ඇතුලත් නොවේද තවද,

(ආ) යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වූ ''ආදයම්'' යන්නෙන් එම වෙළඳ ව්‍යාපාරය සම්බන්ධයෙන් ඇතුලත් වූ ගනුදෙනුවලින් හෝ එම ව්‍යාපාරය පවත්වාගෙන යාමෙහි ලා ඉටුකළ සේවය සඳහා ලැබුණු හෝ ලැබිය යුතු මුළු මුදල අදහස් වන අතර, ඊට මේවා ද ඇතුළත් වේ.

(i) මුදල දෙන්නෙකු, මුදල් ණයට දෙන්නකු හෝ බඩු උකස් ගන්නකු සම්බන්ධයෙන් වන අවස්ථාවක ණය වශයෙන් ඔහු විසින් දෙන ලද මුදල්, ඒ ණය සඳහා ඔහුට ලැබුණු හෝ ලැබිය යුතු පොළිය සහ ඒ ණය සම්බන්ධයෙන් ගාස්තු හෝ වෙනත් අය කිරීම් වශයෙන් ඔහුට ලැබුණු මුදල්;

(ii) වෙන්දේසිකරුවෙකු සම්බන්ධයෙන් වන විට සහ (iii) ඡේදයේ විධිවිධාන වලට යටත්ව තැරැව්කරුවෙකු හෝ කොමිස් නියෝජිතයෙකු සම්බන්ධයෙන් වන අවස්ථාවක -

(අ) ඔහු විසින් විකුණන ලද ඉඩම් හෝ ඔහු විසින් හේතු කාරක වූ විකිණීම් සම්බන්ධයෙන් වූ විට, ඒ විකිණීම සම්බන්ධයෙන් ඔහු විසින් ක්‍රියාත්මක කරන ගණුදෙනු හා ඉටු කරන ලද සේවා සඳහා ඔහුට ලැබුණු හෝ ලැබිය යුතු හෝ කොමිස් මුදල් හා සේවා ගාස්තු;

(ආ) ඔහු විසින් විකුණන ලද යම් බඩු හෝ ඔහු විසින් හේතු කාරක වූ විකිණීම සම්බන්ධයෙන් වූ විට, ඒ බඩු ගැණුම්කරු විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු මුළු මුදල;

(iii) (අ) ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකු නොවන, යම් තැනැත්තෙකු වෙනුවෙන්, ඒ අනේවාසික තැනැත්තාගේ යම් බඩු විකුණන හෝ විකිණීමෙහිලා හේතුකාරක වන්නාවූ,

(ආ) ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත යම් බඩු අපනයන කරන්නකු වෙනුවෙන් ක්‍රියා කරන්නා වූ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන වෙනත් යම් තැනැත්තෙකු වෙනුවෙන්, යම් බඩු විකිණීමෙන් ලත් මුදල ඒ වෙනත් තැනැත්තාගේ වෙළඳ ව්‍යාපාරයේ ආදයමට ඇතුළත් කරනු ලැබූ ඒ වෙනත් තැනැත්තාගේ ඒ බඩු ශ්‍රී ලංකාවේ විකිණීමෙහිලා හේතු කාරක වන්නා වූ -

යම් තැරැව්කරුවෙක් හෝ කොමිස් නියෝජිතයෙකු සම්බන්ධයෙන් වන අවස්ථාවක, එසේ විකිණීමෙහි, ක්‍රියාකිරීමෙහිලා හෝ එසේ විකිණීම සඳහා හේතු කාරක වීමෙහිලා ඒ තරැව්කරු හෝ කොමිස් නියෝජිතයා විසින් ක්‍රියාත්මක කරන ලද යම් ගණුදෙනු හෝ ඉටු කරන ලද සේවා සම්බන්ධයෙන් ඔහුට ලැබුණු හෝ ලැබිය යුතු කොමිස් හෝ ගාස්තු සහ කොටස් තැරැව්කරුවෙකු හෝ නිෂ්පාදන තැරැව්කරුවෙකු සම්බන්ධයෙන් වන අවස්ථාවක ඒ තැරැව්කරු හෝ කොමිස් නියෝජිතයා විසින් ක්‍රියාත්මක කරන ලද යම් ගණුදෙනු හෝ ඉටු කරන ලද සේවා සම්බන්ධයෙන් ඔහුට ලැබුණු හෝ ලැබිය යුතු කොමිස් මුදල් හෝ ගාස්තු, සහ

(iv) යම් අධ්‍යාපනික ආයතනයක් හෝ පාසලක් පවත්වාගෙන යන යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් වන අවස්ථාවක ඒ අධ්‍යාපනික ආයතන හෝ පාසල හෝ සතු මුදල් ආයෝජන කිරීමෙන් ලැබුණු ලාභ අතහැර එම අධ්‍යාපනික ආයතන හෝ පාසල් පවත්වා ගෙන යෑමෙන් ඒ තැනැත්තාට ලැබුණු හෝ ලැබීමට ඇති මුළු මුදල අදහස් වන නමුත් ප්‍රාග්ධනය වත්කම් විකිණීමෙන් ලැබුණු හෝ ලැබිය යුතු යම් මුදලක් ඊට ඇතුළත් නොවේ.

02-11/2

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

2018 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 සමග කියවිය යුතු 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වන තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2018 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර වැල්ලවාය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9 (2) 9(3) වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරමි.

පාලිත දේවනාරායන,
ලේකම්,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2017 දෙසැම්බර් මස 04 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

උපලේඛන අංක 1

| *අනු. අංකය* | *(I) තීරුව කර්මාන්තයේ ස්වභාවය* | *(II) තීරුව* | | |
|---|---|---|---|---|
| | | *ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු.)* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු.)* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු.)* |
| 01. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | ශීතකරන හා වායුසමීකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | කම්මලක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | ඇඟළුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

02-11/3

---

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

2018 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තියේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 2018 වර්ෂයේදී පහත උප ලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම එකී II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2018 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, මෙම බද්ද වැල්ලවාය ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9(2) 9(3) වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරමි.

උපලේඛනය

| | | | රු. ශත |
|---|---|---|---|
| 01. | (i) | මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක්, හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| | (ii) | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා | |
| | | (අ) වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| | | (ආ) වෙළඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| | (iii) | සෑම කරත්තයක් සඳහා | 20 0 |
| | (iv) | සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| | (v) | සෑඹ අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| | (vi) | සෑම ඇතෙකු සඳහා | 50 0 |

02-11/4

---

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

2018 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 149 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2018 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් අය කර බලපත්‍රයක් නිකුත් කල යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9(2) 9(3) වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරමි.

පාලිත දේවනාරායන,
ලේකම්,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2017 දෙසැම්බර් මස 04 වන දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

උපලේඛනය අංක 01

| *අනු. අංකය* | *(I) තීරුව ව්‍යාපාරයේ ස්වභාවය* | *(II) තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | බත්කඩ ආපනශාලා සහ තේ හෝ කෝපි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | (I) තීරුව ව්‍යාපාරයේ ස්වභාවය | (II) තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල් | | |
|---|---|---|---|---|
| | | රු. 750 නොඉක්මවන අවස්ථාවක | රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | රු. 1,500 ඉක්මවන අවස්ථාවක |
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 05. | කිරි පට්ටි හා කිරි වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | ආහාර වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | කොණ්ඩා සැකසුම් සැලුන්හලක් සහ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | සංචාරක වෙළෙන්දෝ | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ගව ගාලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම | | | |

උපලේඛන අංක (ii)

| | (i) තීරුව | (ii) තීරුව | | |
|---|---|---|---|---|
| i. | ගල් කොරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ii. | කළු ගල් ඇඹරීම යන්ත්‍රානුසාරයෙන් මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| iii. | කළුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| iv. | ගෑස් සිලින්ඩර් ගබඩාකර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| v. | ටින්කර් හා ස්ප්‍රේ පේන්ට් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| vi. | ෆයිබර් ග්ලාස් වැඩපලක් | 500 0 | 750 0 | 1,000 0 |
| vii. | වඩුමඩුවක් පවත්වාගෙන යාම සඳහා (යාන්ත්‍රික නොවන) | 500 0 | 750 0 | 1,000 0 |
| viii. | යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| ix. | ටයර් ටියුබ් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| x. | ජංගම අයිස්ක්‍රීම් අලෙවිකරුවන් | 500 0 | 750 0 | 1,000 0 |
| xi. | ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම සදහා | 500 0 | 750 0 | 1,000 0 |
| xii. | පිරිපහදු ජලය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| xiii. | තුනපහ ඇඹරුම් හලක් පවත්වාගෙන යාම අශ්වබල 1 සිට 10 දක්වා | 500 0 | 750 0 | 1,000 0 |
| xiv. | කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| xv. | පළතුරු කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| xvi. | මෝටර් රථ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| xvii. | යකඩ ආශ්‍රිත නිෂ්පාදනයන් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| xviii. | වී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| xix. | ධාන්‍ය ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| xx. | අවමංගල්‍ය සේවා ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| xxi. | සිමෙන්ති ආශ්‍රිත කොන්ක්‍රීට් නිෂ්පාදන සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| xxii. | වාහන සේවා කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |

| *අනු. අංකය* | *(I)තීරුව ව්‍යාපාරයේ ස්වභාවය* | *(II) තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| xxiii. | කොප්පරා ඇඹරුම් කිරිමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| xiv. | සත්ත්ව ගොවිපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| xxv. | කාබනික පොහොර නිෂ්පාදන හා අලෙවි ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| xxvi. | මෙම පනත යටතේ බලපත්‍ර ලබාගත යුතු සංචාරක වෙළඳාමක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| xxvii. | බිම්මල් වගා කිරිමේ හා අලෙවි කිරිමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| xviii.. | සරුවත් පැණිබීම අලෙවිසැල් | 500 0 | 750 0 | 1,000 0 |
| xxix. | මිරිස් කුළුබඩු සහල් ධාන්‍ය වර්ග ඇතුළු ආහාර ද්‍රව්‍ය ඇසුරුම් ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| xxx. | කෘෂි රසායන ද්‍රව්‍ය පොහොර අලෙවි කිරිමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| xxxi. | විසිතුරු, කෘෂි භෝග, දූවමය පැළ තවාන් කිරිම හා අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| xxii. | සාත්තු සේවා සැපයිමේ ඒජන්සි හෝ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| xxiii. | උක් ඇඹරුම් හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| xxiv. | කොහු ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

02-11/5

---

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ ප්‍රචාරක දැන්වීම් - (දෘෂ්‍ය පරිසර)

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන විෂය භාර ගරු ඇමතිතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වන ඡේදය යටතේ ප්‍රචාරක දැන්වීම් දෘෂ්‍ය පරිසරය අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල කුමන ආකාරයක හෝ ප්‍රචාරක දැන්වීම්, බැනර් ආදිය ඉදිකිරිම හා ප්‍රදර්ශනය කිරිම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු ප්‍රමාණයෙන් 2018.01.01 වන දින සිට පනවා අය කිරිමට වැල්ලවාය ප්‍රාදේශීය සභාව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9(2) 9(3) වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරමි.

පාලිත දේවනාරායන,
ලේකම්,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2017 දෙසැම්බර් මස 04 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

*බලපත්‍ර ගාස්තු :*

| අනු. අංකය | ප්‍රචාරක දැන්වීම් විස්තරය | 2017 වර්ෂයේ අවසර පත්‍රය සඳහා අය කරන ගාස්තු | | |
|---|---|---|---|---|
| | | දින 01 සිට දින 30 දක්වා රු. ශ. | දින 01 සිට දින 90 දක්වා රු. ශ. | මාස 03 කට වැඩි හෝ වර්ෂයක කාලයක් සඳහා රු. ශ. |
| 01. | බිත්තියක හෝ තාප්පයක ප්‍රදර්ශනය කරන එක් හතරැස් අඩියකට (චිත්‍රපටි පෙන්වීම සම්බන්ධ දැන්වීම් නොවන) | 15 0 | 35 0 | 50 0 |
| 02. | දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමක් සඳහා එක් හතරැස් අඩියකට (චිත්‍රපටි පෙන්වීම් සම්බන්ධ දැන්වීම් නොවන) | 40 0 | 50 0 | 110 0 |
| 03. | යම් තැනැත්තෙකු විසින් උසුලාගෙන යනු ලබන හෝ ගමන් කරන වාහනයකට සවිකොට ඇති ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක බැනරයක් සඳහා එක් හතරැස් අඩියකට (වෙළඳ කටයුත්තක් හෝ ව්‍යාපාරයක් සඳහා පාවිච්චි කරන වාහනයකට එම වෙළඳ කටයුත්තේ හෝ ව්‍යාපාරයේ ස්වභාව දැක්වෙන සහ අයිතිකරුගේ නම, ලිපිනය, දුරකථන අංකය හෝ ටෙලෙක්ස් අංකය දැක්වෙන ප්‍රචාරක දැන්වීමක් නොවන) | 15 0 | 30 0 | 50 0 |
| 04. | චිත්‍රපට පෙන්වීම සම්බන්ධ එක් ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක බැනරයක් සඳහා එක් හතරැස් අඩියකට | 10 0 | 15 0 | 20 0 |
| 05. | චිත්‍රපට පෙන්වීම සම්බන්ධ නොවන එක් ප්‍රචාරක බැනරයක් සඳහා එක් හතරැස් අඩියකට | 30 0 | 40 0 | 75 0 |
| 06. | දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කරන විද්‍යුත් ප්‍රචාරක දැන්වීමක් සඳහා එක් හතරැස් අඩියකට | 70 0 | 90 0 | 600 0 |
| 07. | දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කරන විද්‍යුත් ප්‍රචාරක එම පුවරුවක් සඳහා එක් හතරැස් අඩියකට | 45 0 | 60 0 | 200 0 |

02-11/6

---

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

### 2018 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පිළිබඳ දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 153 වගන්තිය අනුව වැල්ලවාය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හා එකී පනතේ 09(2) හා 9(3) වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

- (අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ
- (ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක හෝ
- (ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය හා ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 10:1ට වඩා අඩු වන්නේ නම්

එකී ඉඩම සංවර්ධනය නොකල ඉඩමක් වශයෙන් සැලකීමට සහ එකී සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2018 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් 2% ක වාර්ෂික බද්දක් වැල්ලවාය ප්‍රාදේශීය සභා සීමාව තුළ පනවා අය කිරීමට තීරණය කරන ලද බව නිවේදනය කරමි.

පාලිත දේවනාරායන,
ලේකම්,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2017 දෙසැම්බර් මස 04 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

02-11/7

---

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

2018 වර්ෂය සඳහා ගාස්තු පිළිබඳ දැන්වීම

වැල්ලවාය ප්‍රාදේශීය සභා සීමාව තුළ පහත උපලේඛනයේ සඳහන් සහතික පත්‍ර ලබාදීමේදී හා අයදුම්පත්‍ර නිකුත් කිරීමේදී හා සේවා සැපයීමේ දී පහත උපලේඛනයේ සඳහන් ගාස්තු ප්‍රමාණයන් 2018 වර්ෂයට අයකිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(2) හා 09(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර තීරණය කරන ලද බව නිවේදනය කරමි.

පාලිත දේවනාරායන,
ලේකම්,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2017 දෙසැම්බර් මස 04 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *විස්තරය* | *රු. ශ.* |
|---|---|---|
| 01. | වීථිරේඛා සහ නොපරවා ගන්නා සහතික නිකුත් කිරීමේ දී අයකරන ගාස්තුව | 1,000 0 |
| 02. | වීථිරේඛා සහ නොපවරා ගන්නා සහතික නිකුත් කිරීමේ දී අය කරන අයදුම්පත්‍ර ගාස්තුව | 100 0 |
| 03. | තක්සේරු බදු ලේඛනයේ අයිතිවාසිකම් ඇතුළත් කිරීම සඳහා ඉදිරිපත් කරන ඔප්පු සංක්ෂිප්ත විස්තරය ඇතුළත් අයදුම්පත්‍ර ගාස්තුව | 100 0 |
| 04. | සංවර්ධන කාර්ය සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ දී අයකරනු ලබන ගාස්තුව | 1,000 0 |
| 05. | ඉඩමක් අනු කොටස්වලට බෙදීමේදී ඒ සඳහා වූ අයදුම්පත්‍ර ගාස්තු | 500 0 |
| 06. | ව්‍යාපාර කටයුතු සඳහා වැල්ලවාය ක්‍රීඩා පිටිය බදු දීමේදී දිනකට අයකරන ගාස්තුව | 10,000 0 |
| 07. | ක්‍රීඩා කටයුතු සඳහා වැල්ලවාය ක්‍රීඩා පිටිය බදු දීමේදී දිනකට අයකර ගාස්තුව | 5,000 0 |
| 08. | වැල්ලවාය නගරයේ අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා 10' x 15' භූමි කොටසක් බදු දීමේදී දිනකට අයකරන ගාස්තුව | 3,000 0 |
| 09. | වැල්ලවාය නගරයෙන් පිටත අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා 10' x 15' භූමි කොටසක් බදු දීමේදී දිනකට අයකරන ගාස්තුව | 2,000 0 |
| 10. | මහින්ද රාජපක්ෂ සම්මන්ත්‍රණ ශාලාව ව්‍යාපාර කටයුතු සඳහා බදු දීමේදී දිනකට අයකරන ගාස්තුව | 20,000 0 |
| | උත්සව කටයුතු සඳහා බදු දීම | 30,000 0 |
| 11. | ආදාහනාගාරයේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා ගාස්තු අය කිරීම | |
| | බල ප්‍රදේශය තුළ | 5,500 0 |
| | බල ප්‍රදේශයෙන් පිටත | 7,500 0 |

| | | |
|---|---|---|
| 12. | මහින්ද රාජපක්ෂ සම්මන්ත්‍රණ ශාලාව රාජ්‍ය ආයතනය සඳහා බදුදීමේදී දිනකට අයකරන ගාස්තුව | 5,000 0 |
| 13. | මහින්ද රාජපක්ෂ සම්මන්ත්‍රණ ශාලාව බදුදීමේදී අයකරන ඇප තැන්පත් මුදල | 3,000 0 |
| | ජේ. එම්. කුමාරදාස අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව බදු දීම දිනකට | 2,500 0 |
| 14. | වැල්ලවාය බල ප්‍රදේශය තුළ බැකෝ යන්ත්‍රය සේවා සැපයීම සඳහා ගාස්තු අයකිරීම - | |
| | ක්‍රියා කරන පැය 01 ට | 2,500 0 |
| | ධාවන පැය 01 කට (යාමට හා ඒමට) | 1,600 0 |
| 15. | වැල්ලවාය බල ප්‍රදේශය තුළ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය සේවා සැපයිම සඳහා ගාස්තු අය කිරිම - | |
| | ක්‍රියා කරන පැය 01ට | 4,500 0 |
| | ධාවන පැය 01 කට (යාමට හා ඒමට) | 2,500 0 |
| 16. | වැල්ලවාය බල ප්‍රදේශය තුළ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය සේවා සැපයීම සඳහා ගාස්තු අය කිරිම- | |
| | ක්‍රියා කරන පැය 01ට | 5,000 0 |
| | ධාවන පැය 01 කට (යාමට හා ඒමට) | 3.000 0 |
| 17. | වැල්ලවාය බල ප්‍රදේශය තුළ මාර්ග තලනය සේවා සැපයීම සඳහා ගාස්තු අයකිරීම | |
| | ක්‍රියා කරන පැය 01 ට | 3,600 0 |
| 18. | වැල්ලවාය බල ප්‍රදේශය තුල ගලි බවුසරය සේවා සැපයීම සඳහා ගාස්තු අයකිරීම - | |
| | පළමු බවුසරය සඳහා | 3,850 0 |
| | අමතර බවුසරය සඳහා | 2,750 0 |
| | සෑම බවුසරයකටම යාමට සහ ඒමට කි. මී. 01ට | 60 0 |
| | ක්‍රියාකරු හා සහාය දීමනා සඳහා | 500 0 |
| 19. | වැල්ලවාය බල ප්‍රදේශයෙන් පිටත ගලි බවුසරය සේවා සැපයිම සඳහා ගාස්තු අයකිරීම - | |
| | සෑම බවුසරයක් සඳහා | 4,500 0 |
| | සෑම බවුසරයකටම යාමට සහ ඒමට කි. මී. 01 ට | 60 0 |
| | ක්‍රියාකරු හා සහාය දීමනා සඳහා | 500 0 |

02-11/8

---

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

### 2018 වර්ෂය සඳහා කසල ඉවත් කිරිම පිළිබඳ ගාස්තු පිළිබඳ දැන්වීම

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ II වන වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදා 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පලකර ඇති 09 වන කලාප කසල ශෝධන අතුරු ව්‍යවස්ථාව වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරිමට වැල්ලවාය ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන 1990.11.01 දින අංක 635 පළාත් සභා *ගැසට් පත්‍රයේ* පළ කර ඇති නිවේදනය ප්‍රකාර මෙම අතුරු ව්‍යවස්ථාවේ අංක 4 වැනි වගන්තිය අනුව වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත කසල ඉවත් කිරිමේ කටයුතු කරන ප්‍රදේශයේ වරිපනම් බදු නොගෙවන දේපල හිමි අයගෙන් හෝ එම දේපලවල පදිංචි අයගෙන් කාර්තුවකට ව්‍යාපාර ස්ථාන වලින් හා කාර්යාල හා ආයතන වලින් කාර්තුවකට රුපියල් 200.00 ක් පදිංචිය සඳහා යොදා ගනුලබන නේවාසික ස්ථානවලින් රුපියල් 100.00 ක කසල බද්දක් මාසිකව අයකිරීමටත් එම මුදල සෑම මසකම ආරම්භයේ සිට දින හතක් ඇතුලත අය කිරීමට තීරණය කරන ලද බව නිවේදනය කරමි.

පාලිත දේවනාරායන,
ලේකම්,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2017 දෙසැම්බර් 04 වැනි දින,
වැල්ලාවය ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.

02-11/9

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

### 2018 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9(2) 9(3) වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ විනෝද කාර්ය උදෙසා ගාස්තු අය කර ප්‍රදර්ශනය කරනු ලබන සංදර්ශනවලින් 2018 වර්ෂය සඳහා විනෝද බද්දක් පනවා අයකිරීමට තීරණය කරමි.

ඉහත කී විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියෙන් පළාත් පාලන ආයතනවලට ලැබී ඇති බලතල ප්‍රකාර විනෝද බද්ද පනවා අය කර ගත යුතු බවත් එකී විනෝද කාර්යය පවත්වන දිනට පෙර එකී විනෝද බද්ද වැල්ලවාය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් තීරණය කරමි.

267 වන අධිකාරය වන විනෝද බදු ආඥාපනතේ කාර්යය සඳහා අදාල වන කිසියම් විනෝද කටයුත්තක් වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදු කරන සෑම තැනැත්තකු විසින් ම එම විනෝද කටයුත්ත,

*(අ)* සිනමා දර්ශනයක් වන විට ඒ සඳහා ඇතුළත් කර ගන්නා තැනැත්තන්ගෙන් අයකර ගන්නා මුදල් ප්‍රමාණයෙන් 7.5% ක ප්‍රමාණයකට සමාන මුදලක් ද සහ,

*(ආ)* වෙනත් විනෝද කාර්යයක් වන විට ඒ සඳහා ඇතුළත් කර ගන්නා තැනැත්තන්ගෙන් අය කර ගන්නා මුදල් ප්‍රමාණයෙන් 10% ක ප්‍රමාණයකට සමාන මුදලක් ද,

පාලිත දේවනාරායන,
ලේකම්,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2017 දෙසැම්බර් මස 04 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

02-11/10

---

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

### 2018 වර්ෂය සඳහා ඇතැම් ඉඩම් විකිණීම මත බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9(2), 9(3) වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) 2(1) වගන්ති ප්‍රකාර වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජකයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසි හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (1%) බද්ද වැල්ලවාය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට තීරණය කරමි.

පාලිත දේවනාරායන,
ලේකම්,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2017 දෙසැම්බර් මස 04 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

02-11/11

---

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

### 1987අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ නගර නිර්මාණ යටතේ අය කරන ඉඩම් අනුබෙදුම් හා පෙරසැරි ගාස්තු පැනවීම

| වර්ග මීටර් ගණන | එක් කොටසක මිල (රු.) |
|---|---|
| 150-300 | 500 0 |
| 301-600 | 400 0 |
| 601-900 | 300 0 |
| 901 වැඩි | 200 0 |

**පෙරසැරි ගාස්තු ගොඩනැගිලි :**

| *ගෙබිම ප්‍රමාණය* | *නේවාසික (රු.)* | *වාණිජ (රු.)* |
|---|---|---|
| වර්ග අඩි 485 අඩු | 500 0 | 1,000 0 |
| 485-970 | 1,500 0 | 2,000 0 |
| 970-1940 | 2,500 0 | 3,000 0 |
| 1940-2910 | 3,500 0 | 4,000 0 |
| 2910-4842 | 4,500 0 | 6,000 0 |
| 4842-7263 | 5,500 0 | 8,000 0 |
| 7263-9684 | 6,500 0 | 10,000 0 |
| 9684-13181 | 7,500 0 | 12,000 0 |
| 13181 වැඩි | 7,500 0 | 12,000 0 |
| | වර්ග අඩි 13192 ඉක්මවීමෙන් පසු සෑම වර්ග අඩි 969 කටම රු. 1000.00 බැගින් | වර්ග අඩි 13192 ඉක්මවීමෙන් පසු සෑම වර්ග අඩි 969 කටම රු. 1,250 0 බැගින් |

පාලිත දේවනාරායන,
ලේකම්,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2017 දෙසැම්බර් මස 04 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

02-11/12

---

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

### 2018 වර්ෂය සඳහා වරිපනම් බදු පිළිබඳ දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ (134) 1 වන උපවගන්තියෙන් වැල්ලවාය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හා එකී පනතේ 09(2) හා 09(3) වගන්තිවලින් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාර වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රසිද්ධ කර ඇති ප්‍රදේශය තුළ පිහිටි සියලුම වාණිජ, ගොඩනැගිලි, ඉඩම් හා ගෙපත් රජයේ දේපළ සඳහා 2013 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද දේපළ තක්සේරුව හා 8% ක් වූ වරිපනම් බදු ප්‍රතිශතයම පදනම් කර ගනිමින් ද වරිපනම් බදු ගෙවීමේදී 2018 ජනවාරි මස 31 දිනට පෙර 2018 වර්ෂය සඳහා සම්පූර්ණ වරිපනම් බදු ගෙවන විට 10% ක වට්ටමක් ද කාර්තු වශයෙන් ගෙවීමේ දී කාර්තුවේ මුල් මස ගෙවන්නේ නම් 5% ක වට්ටටමක්ද ලබා දීමට ද තීරණය කරමි. ඒ අනුව කාර්තු වශයෙන් වරිපනම් බදු ගෙවනු ලබන විට පළමු කාර්තුව සඳහා ජනවාරි මස 31 වැනි දිනට පෙර වරිපනම් බදු ගෙවනු ලබන විට 5% ක වට්ටමක්, දෙවන කාර්තුව සඳහා අප්‍රේල් මස 30 වැනි දිනට පෙර වරිපනම් බදු ගෙවනු ලබන විට 5% ක වට්ටමක් ද, තුන්වන කාර්තුව සඳහා ජූලි මස 31 වැනි දිනට පෙර වරිපනම් බදු ගෙවනු ලබන විට 5% ක වට්ටමක්ද හතරවන කාර්තුව සඳහා ඔක්තෝබර් මස 31 වැනි දිනට පෙර වරිපනම් බදු ගෙවනු ලබන විට 5% ක වට්ටමක් ද ලබා දෙනු ලැබේ.

පාලිත දේවනාරායන,
ලේකම්,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2017 දෙසැම්බර් මස 04 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

02-11/13

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2018** | | | | | |
| **පෙබරවාරි** | 2018.02.02 | සිකුරාදා | 2018.01.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.02.09 | සිකුරාදා | 2018.01.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.02.16 | සිකුරාදා | 2018.02.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.02.23 | සිකුරාදා | 2018.02.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2018.03.02 | සිකුරාදා | 2018.02.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.03.09 | සිකුරාදා | 2018.02.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.03.16 | සිකුරාදා | 2018.03.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.03.23 | සිකුරාදා | 2018.03.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.03.29 | බ්‍රහස්පතින්දා | 2018.03.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2018.04.06 | සිකුරාදා | 2018.03.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.04.12 | බ්‍රහස්පතින්දා | 2018.03.29 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2018.04.20 | සිකුරාදා | 2018.04.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.04.27 | සිකුරාදා | 2018.04.12 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.